තාක්ෂණික තොරතුරු පත්‍රිකාව

කෘෂි තාක්ෂණ ලුහුඬින්

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය

වෙළුම 9 අංක 5 2007 සැප්-ඔක්

මෙවර කලාපයෙන්

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නව නිර්දේශිත ප්‍රභේද
- පණු දියර පොහොර
- මැකඩමියා භෝගය හඳුනා ගනිමු

සංස්කරණය
ජයන්තා ඉලන්කෝන්
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය
තැ.පෙ. 18, පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තු නව නිර්දේශිත ප්‍රභේද

2007 ජුලි මස 4 වන දින පැවැත්වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රභේද නිර්දේශ කිරීමේ කමිටු රැස්වීමේදී වැල් අල ප්‍රභේද 2ක්, ජමනාරං ප්‍රභේදයක්, පැණි දෙඩම් ප්‍රභේදයක් හා මැකඩමියා ප්‍රභේද 2 ක් නිර්දේශ කරන ලදී.

මැකඩමියා ශාකය සහ ඵල

කැකුළු අල

රාජ අල

රඹංගල ජමනාරං ප්‍රභේදය

පැණි දෙඩම් MKD ප්‍රභේදය

"අපි වවමු - රට නගමු" දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගන්වමු

රාජ අල සහ කැකුළු අල

වැල් අල ප්‍රභේද (ඩයස්කෝරියා අලාටා) *(Dioscoria alata)*

වැල් අල විශේෂ රාශියක් ලංකාවේ බොහෝ ප්‍රදේශවල වගාවේ. ඒවා ගෙවතු වල මිශ්‍ර භෝග වගාවන් සඳහා හොඳින් අනුවර්තනය වී ඇත. තවද, ඒවා ආහාර සුරක්ෂිතාවය සඳහා වැදගත් වන භෝග කාණ්ඩයක් වන අතරම, වැල් අල සඳහා අපනයන විභවයද වැඩිවෙමින් පවතී.

ගන්නොරුව උද්‍යාන භෝග පරයේෂණ හා සංවර්ධන ආයතනය විසින් 1982-1989 කාලසීමාව තුළදී වගා දර්ශ 100 ක් පමණ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් එකතු කර ඇත. සමහර දර්ශ සඳහා ප්‍රදේශ අනුව විවිධ නම් භාවිතා කරන අතර, විවිධ ක්ලෝන, විවිධ ස්ථාන වලදී එකම නමින් හැඳින්වීම නිසා ප්‍රභේද හඳුනා ගැනීමේ විවිධ ගැටළු මතුවූ බැවින්, රූප ලක්ෂණ 25 ක් මත එකතු කරන ලද දර්ශ ලක්ෂණීකරණය කරන ලදී.

මේ දර්ශ අතුරින් ඉහළ උපයෝගිතාවයන් පෙන්වූ දර්ශ දෙකක් ප්‍රභේද අත්හදා බැලීමේ පර්යේෂණ ප්‍රතිඵල මත වගා කිරීම සඳහා නිර්දේශ කර ඇත. ඒවා නම් :

(a) **කැකුළු අල**

(b) **රාජ අල**

ඒවායේ විශේෂිත ලක්ෂණ පහත සඳහන් වේ.

ලක්ෂණ	**රාජ අල**	**කැකුළු අල**
පත්‍ර වර්ණය	තද කොළ පාට	ලාකොළපාට
නාරටි, නටු හා පත්‍රිකා වල ඇන්තොසයනින් පිහිටීම	දක්නට ලැබේ	නැත
වායව අල හට ගැනීම	කලාතුරකින්	කලාතුරකින්
වැලකට හට ගන්නා අල සංඛ්‍යාව	01	1-2
අලයෙහි පොත්තේ කෙඳි පිහිටීම	නැත	නැත
පොත්තේ වර්ණය	දුඹුරු	දුඹුරු
මාංශලයේ වර්ණය	ලාදම්	කහමය සුදු
ඔක්සිකරණය මගින් මාංශලය දුඹුරු පැහැවීම	ඉතාම සුළු ලෙස	මධ්‍යස්ථ
තෙතමනය %	68.2	75.9
පිෂ්ඨය % (තෙත් බර අනුව)	23.8	19.7
කෙඳි % (තෙත්බර අනුව)	5.1	6.2
බ්‍රික්ස් අගය	8.0	8.0
රස (taste)	පිටි සහිත	පිටි සහිත හා පැණි රසයෙන් යුතු
රසවත්භාවය (palatability)	හොඳයි/සුවඳවත්ය	හොඳයි/මධ්‍යස්ථ ලෙස නානු සහිතයි.
අලවල සාමාන්‍ය බර අස්වැන්න	1-1.5 කි.ග්‍රෑ.	2.5-3.0 කි.ග්‍රෑම්

ප්‍රභේද සංවර්ධනය - කේ.පී.යූ. ද සිල්වා මයා, ඒ. ප්‍රේමතිලක මිය
එස්.එන්. හරිස්චන්ද්‍ර මිය, එම්. තවබාලචන්ද්‍රන් මිය,
එම්. ඒ කුලරත්න මයා

ජම්නාරං - *රුහංගල ජම්නාරං ප්‍රභේදය*

රුහංගල කෘෂි පර්යේෂණ ආයතනය මගින් මෙහෙයවන ලද උසස් ගුණාත්මයෙන් යුතු ඉහළ අස්වනු දෙන නාරං ප්‍රභේද හඳුනා ගැනීමේ අධ්‍යයනයට අනුව ඉහළ අස්වනු ලබාදෙන ප්‍රභේදයක් හඳුනා ගන්නා ලදී. එය MS-1 යන නාමය යටතේ පර්යේෂණ සිදුකර **රුහංගල ජම්නාරං** ලෙස වගා කිරීම සඳහා නිර්දේශ කරන ලදී.

වසර 7 ක් පමණ වයසැති ගසකින් වසරකට ගෙඩි 180 ක් පමණ ලබාගෙන ඇත. ගෙඩියක බර ග්‍රෑම් 80 ක් පමණ වේ.

හොඳ වර්ධන වේගයක් සහිත ශාක, සුසංහිත (comect) පත්‍ර වියනකින් යුතුවේ. නියං තත්ත්ව සඳහා හොඳින් ඔරොත්තු දේ. ශාක කප්පාදු කර නඩත්තු කළ යුතුය.

ලක්ෂණ

ගෙඩි වල පොත්තේ වර්ණය	කහ තැඹිලි
ලෙලි ගැලවීම	පහසුය
යුෂ %	51.22
ආම්ලිකතාව % (සිට්‍රික් අම්ලය ලෙස)	1.0
pH	3.71
යුෂ වල වර්ණය	කහ තැඹිලි
බ්‍රික්ස් අගය	10.8
ගුණාත්මය	පැණි රස සහ සුලු ලෙස ආම්ලිකයි.

පළිබෝධ තත්ව වලට ඔරොත්තු දීම

කබොලු රෝගයට ප්‍රතිරෝධී වේ. රක්ත පටල රෝගය හා පිළිකා රෝගයට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. පිටිපුස් හා මැලියම් වැස්සීමට මධ්‍යස්ථ ලෙස පාත්‍ර වේ.

කුඩිත්තන්ගේ හානි දක්නට ලැබේ. මයිටා, පළතුරු මැස්සා, කොරපොතු කෘමින් සහ සිට්‍රස් සමනළයා යන පළිබෝධකයන්ගේ හානි දක්නට ලැබෙන නමුත්, බහුල නොවේ. පිටිමකුණා සහ කුඩිත්තන්ගේ හානිය කලාතුරකින් දක්නට ලැබේ.

ප්‍රභේද සංවර්ධනය - එම්.ජී.බී. හේමචන්ද්‍ර
පර්යේෂණ නිලධාරී

පැණි දොඩම් -MKD ප්‍රභේදය

මදුරුකැටිය හා රුහංගල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථාන විසින් කරන ලද පර්යේෂණ වලට අනුව ගුණාත්මයෙන් යුතු පැණිදොඩම් ප්‍රභේදයක් **MKD** නමින් වගාව සඳහා නිර්දේශ කරන ලදී.

ඉහළ වර්ධන වේගයක් සහිත ශාකයේ නිදහස් ලෙස පිහිටි පත්‍ර වියනකින් යුතුවේ. ඉහළ අස්වනු දැරීමේ හැකියාවක් ඇත. නියං තත්ත්ව වලට ඔරොත්තු දීමේ හැකියාව ඇත.

ලක්ෂණ

ගෙඩිවල පොත්තේ වර්ණය	කොළ
පොතු ගැලවීම	අපහසුයි
යුෂ%	38
ආම්ලිකතාවය	
(සිට්‍රික් අම්ලය ලෙස)	1.1
pH	3.2
යුෂයේ වර්ණය	කහ
බ්‍රික්ස් අගය	10
කාපල සංඛ්‍යාව	6.2
ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම්	296.3
රසය	පැණි රස අඩු හා ආම්ලික

පලිබෝධ තත්ව වලට ඔරොත්තු දීමේ හැකියාව

උඩරට අතරමැදි කලාපය

පිටිපුස්, පයිටොප්තෙරා දුඹුරු කුණුවීම, රක්තපටල රෝගය හා පාදස්ථ කුණුවීමට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ.

පහතරට අතරමැදි කලාපය

පයිටොප්තෙරා දුඹුරු කුණුවීම, රක්තපටල රෝගය, පාදස්ථ කුණුවීමට මධ්‍යස්ථ ප්‍රතිරෝධී වේ. පිටිපුස් රෝගය සඳහා ප්‍රතිරෝධී වේ.

ප්‍රභේද සංවර්ධනය: යූ.බී. දිසානායක, පර්යේෂණ නිලධාරී

එම්.ජී.බී. හේමචන්ද්‍ර, පර්යේෂණ නිලධාරී

කුරක්කන් - ඕෂධ ප්‍රභේද

ශ්‍රී ලංකාවේ වගා කරන ධාන්‍ය වර්ග අතුරින් තුන්වෙනි ස්ථානය කුරක්කන් වලට හිමිවේ. වාර්ෂිකව හෙක්ටයාර 7000 ක් පමණ වගාවේ. දැනට නිර්දේශ කර ඇති කුරක්කන් ප්‍රභේද වන රවි හා රාවණා ප්‍රභේද යල කන්නයට යෝග්‍ය වන අතර මහ කන්නයේ පවත්නා තෙත් කාලගුණ තත්ත්ව වලදී පයිරිකියුලේරියා විශේෂ නිසා හට ගන්නා කොළපාළු රෝග තත්ත්වයට තදින් පාත්‍ර වේ. මේ නිසා මහ කන්නයේ වගා කල හැකි ප්‍රභේදයක අවශ්‍යතාවය පැන නැගී තිබුණි.

මේ නිසා පයිරිකියුලේරියා රෝග තත්ත්වයට තරමක් ඔරොත්තු දෙන ප්‍රභේදයක් දේශීය ජාන සංචිත වලින් වරණය කර හඳුනා ගන්නා ලදී. දැනට කොල පාළු රෝගී තත්වයට ඔරොත්තු දෙන ප්‍රභේදයක් නොමැති බැවින් එය **"ඕෂධ"** යන නමින් වගා කිරීම සඳහා තාවකාලික නිර්දේශයක් (conditional relese) ලබාදෙන ලදී.

මධ්‍යස්ථ උස සහිත මෙම ප්‍රභේදය මල් පිපිමට දින 65 ක් පමණ ගතවන අතර පරිනත වීම සඳහා දින 100-105 ක් ගතවේ.

සාමාන්‍ය පාලන තත්ව යටතේ හෙක්ටයාරයට ටො. 2-3 ක් ලබා ගන් අතර උසස් පාලන තත්ව යටතේ හෙක්ටයාරයට ටො. 3.5-4 ක් පමණත් ලබාගත හැක.

ප්‍රභේද සංවර්ධනය: කේ. එම්. කරුණාරත්න, පර්යේෂණ නිලධාරී

පණු දියර පොහොර

බෝග වගාවේදී පසට යොදන ඝන පොහොරද, පත්‍ර වලින් උරාගන්නා දියර පොහොරද භාවිතා වේ. වෙළඳපොළෙහි දක්නට ලැබෙන දියර පොහොර අධික මිලෙන් යුක්ත බැවින් ඉහළ ගුණාත්මයෙන් යුතු දියර පොහොරක් පහසුවෙන් නිපදවීමට වියදම් අඩු සරල ක්‍රමයක් හඳුන්වා දිය හැකිය. මෙය සියයට සියක්ම කාබනික නිසා සීඝ්‍රයෙන් ප්‍රචලිත වන කාබනික ගොවිතැන සඳහාද මෙය ඉතා වැදගත් වේ.

පස මතුපිට කාබනික ද්‍රව්‍යවල පිවත්වන රතු ගැඩවිලි පනුවන් (රතු පණුවන්) මේ සඳහා භාවිතා වේ. මෙම පණුවන් කාබනික ද්‍රව්‍ය ඉක්මනින් ජිර්ණය කරන අතර විශාල හිතකර ක්ෂුද්‍ර ජිවීන් ප්‍රමාණයක් එම ජිර්ණ විලවලට එකතු කරයි. තවද මෙම ගැඩවිලන්ගේ ශරීරයේ පිටත ඇති ශ්ලේෂ්මලයේ ශාක වර්ධනයට හිතකර ප්‍රතිජිවක, හෝමෝන, එන්සයිම සහ නොයෙකුත් රසායනික ද්‍රව්‍ය ස්‍රාවය කරන ක්ෂුද්‍ර ජිවීන් අති විශාල සංඛ්‍යාවක් ඇත. එබැවින් එම ජිර්ණ විල, මහා සහ ක්ෂුද්‍ර ශාක පෝෂක ද්‍රව්‍ය වලින්ද, හිතකර නොයෙකුත් රසායනික ද්‍රව්‍යවලින්ද පොහොසත් කාබනික පොහොරකි.

මෙම ද්‍රව්‍ය එම කාබනික පොහොරෙන් සවායුක තත්ත්ව යටතේ නිස්සාරණය කර ගැනිම මෙහිදී සිදු කරයි. මෙම පණු දියර පොහොර, දියර පොහොරක් ලෙස මෙන්ම ශාකවල දිරිය වර්ධනය කර, ශාක රෝග පලිබෝධ වලින් ආරක්ෂා කිරිමෙහිලා ද වැදගත් වේ.

පනු දියර පොහොර සෑදිම සඳහා භාවිතා කරන පණුවන් වර්ග හතරක් ඇත එයින් Esienia වර්ගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක. එසේ නැතිනම් ඔබගේ ගෙවත්තේ පස මතුපිට ඇති කාබනික අපද්‍රව්‍ය ගොඩවල් අසල ඇති රතු පැහැති ගැඩවිලි පණුවන් ඒ සඳහා භාවිතා කල හැක. එම පණුවන් පසෙන් පහසුවෙන්ම ලබා ගැනිමට පහත ක්‍රමය අනුගමනය කරන්න. කුණු ගොඩක් පාද එය තෙත් කර ඒ මතට වත්කර (උක් හකුරු) ද්‍රාවණයක පොඟවා ගත් ගෝනි කැබැල්ලක් එලන්න. සතියකින් බැලුවිට ගෝනි කැබැල්ලේ



පණු දියර සෑදීම සඳහා භාජනය සකසන ආකාරය

යටි පැත්තේ ගැඩවිලන් රාශියක් දැකගත හැක. එම ගැඩවිලන් අමුගොම සහිත බඳුනකට දමා තබන්න.

ගැඩවිලි පණුවන්ගෙන් පණු දියරය සාදන අන්දම

මේ සඳහා බැරලයක්, තරමක ලොකු බාල්දියක් හෝ මැටි භාජනයක් භාවිතා කළ හැකිය. භාජනයේ පතුලට අඟලක් පමණ උසින් සිදුරක් විද කරාමයක් සවි කරන්න. කරාමය අවශය වන්නේ දියර පොහොර එකතු කිරිමටයි. බඳුන ගඩොල් කැබලි කිපයක් මත උසින් සිටින සේ සිටුවා තබන්න.

පළමුවෙන්ම තරමක් විශාලව (අඟලක් පමණ) කඩා ගත් ගඩොල් කැබලි තට්ටුවක් අසුරන්න. එම තට්ටුව අඟල් 1 ක්, 2 ක් පමණ උසට පිරවූ පසු දළ වැලි අඟල් 2 ක් පමණ තට්ටුවක් අසුරන්න. (ගඩොල් කැබලි හා වැලි දමන්නේ ද්‍රව්‍ය පෙරීමටය.) ඒ මත අඩි 1 ක් පමණ උසට අමු ගොම තට්ටුවක් දමන්න. ඉන්පසු ක්ෂේත්‍රයෙන් ලබා ගන්නා ලද ගැඩවිලි පණුවන් එක් කරන්න. (එකතු කරන ගැඩවිලි පණුවන් ගණන වැඩිවන තරමට පණු දියර සාදා ගැනිමට ගතවන කාලය අඩුවේ.) සාමාන්‍යයෙන් ලිටර 250 ක බඳුනකට ගැඩවිලන් 500 ක් පමණ දමන්නේ නම් සුදුසුය. මෙම ඇටවුම මාස 1 1/2-2 පමණ තබන්න. මෙහිදී තෙතමනය 85-90% වනසේ තබා ගන්න. අවසානයේ පනු ගහනය තුන් ගුණයකින් පමණ වැඩි වේ.

ඉන්පසු ඉවතලන කාබනික ද්‍රව්‍ය බඳුන පිරෙන තුරු එක් කරන්න. දිරායන රොඩු, කුස්සියෙන් ඉවතලන ද්‍රව්‍ය, තණකොළ රොඩු වැනි ද්‍රව්‍ය මේ සඳහා යොදා ගත හැක. ඉන්පසු මෙම ඇටවුම දිනපතා තෙත් කරන්න. (අනවශ්‍ය ලෙස වැඩිපුර තෙත් කිරීම යෝග්‍ය නොවේ.) මෙයට සෙවන සැපයීම වැදගත්ය. මෙම බඳුන පොල් අතු හෝ පිදුරු සෙවිලි කල පැළක් වැනි තැනක තැබීම ඉතා යෝග්‍යය.

මෙසේ දින 45 ක් පමණ තැබීමෙන් පණු ගහනය තවදුරටත් වැඩි වන අතර, කාබනික ද්‍රව්‍යද දිරාපත් වෙයි. දින 45 කින් පමණ බැලුවිට එක් කරන ලද කාබනික ද්‍රව්‍ය කළු දුඹුරු පැහැති සිනිඳු කොම්පෝස්ට් බවට පත්වී ඇති බවත්, එක් කරන ලද ගැඩවිලන්ගේ ගහනය වැඩිවී ඇති බවත්, පෙනී යයි. මෙම අවස්ථාව වන විට ඇටවුම පණු දියර පොහොර නිපදවීමට සුදුසු තත්ත්වයෙන් ඇත.

දැන් ලිටර 10 ක පමණ ධාරිතාවක් ඇති බඳුනක් (මැටි හෝ ප්ලාස්ටික්) ගන්න. අඩියක් පමණ දිගැති කපු රෙදි වලින් සාදා ගන්නා ලද සිහින් පටි 20 ක් ගෙන ඒවායේ එක කෙලවරක් ගල් කැටයක හොඳින් ගැට ගසන්න. ගල් කැටය සමඟ එම සිහින් තිර බඳුන පණු දියර සාදා ගැනිමට සකස් කල බඳුන මත ඉහලින් එල්ලන්න. ඉන්පසු කපු රෙදිවල නිදහස් කෙලවරවල් එලියට ඇද රූප සටහනේ පරිදි එල්ලීමට සලස්වන්න. දැන් බඳුන තුළට ජලය වත් කරන්න. ටික වේලාවකින් මෙම රෙදි පටිවලින් ජලය පණුවන් සහ කොම්පෝස්ට් අඩංගු බඳුන තුළට බිංදු ලෙස වැස්සීම දැක ගත හැක. මෙලෙස ජලය බඳුන පුරා ඒකාකාරව විහිදෙන ලෙස වැස්සීමට ඇටවුම විධිමත් ලෙස සකස් කර ගන්න. කාබනික ද්‍රව්‍ය සහිත බඳුන තුළට වැස්සෙන ජලය ඒකාකාරීව ඉතා සෙමින් පහලට ගමන් කරයි. එහිදී එම ජලයට වර්මි කොම්පෝස්ට්වල ඇති රසායනික ද්‍රව්‍ය සහ ක්ෂුද්‍ර ජීවීන්ද එකතු වෙයි. පැය 24 දී බඳුනට සවිකර ඇති කරාමය ඇරීමෙන් එක්වන පණු දියර ලබාගත හැක. සෑම දිනම උදේ ජල බඳුන පුරවන්න. මෙසේ දින 10 ක් පමණ නොකඩවා පණු දියර ලබා ගත හැක.



පණු දියර සෑදීම සඳහා ජලය ලබාදෙන ආකාරය

මෙසේ පණු දියර ලබා ගැනීමෙන් පසු එම බඳුන නැවත අමු ගොම සහ කාබනික ද්‍රව්‍ය වලින් පුරවන්න. නැවත එම ද්‍රව්‍ය ජීරණය වනතුරු සහ පණු ගහනය තවදුරටත් වැඩිකර ගැනීමට මාසයක් පමණ තෙත් කරමින් තබන්න. එම කාබනික ද්‍රව්‍ය කොම්පෝස්ට් වූ පසු නැවත පණු සේදුම සෑදිම සඳහා එය භාවිතා කළ හැක.

වැදගත්

01. කොම්පෝස්ට් සෑදීමේදී සහ එයින් පණු දියර පොහොර සෑදීමේදී එම ද්‍රව්‍යවල ඇති තෙතමන ප්‍රමාණය ඉතා වැදගත්ය. එම ද්‍රව්‍ය සවාසු තත්ත්වයෙන් යුතු පණු සේදුම ලබාගත හැක. තවද ජලය වැඩි වුවහොත් පණුවන් ඉවත්වී යනු ඇත. ජලය මදි වුවහොත් පණුවන් විනාශ විය හැක. එබැවින්

ද්‍රව්‍යවල තෙතමනය පවත්වා ගැනීමට පමණක් ජලය යෙදීම වැදගත් වේ.

02. යොදා ගන්නා කපු රෙදි පටි භාජනයේ නොගෑවිය යුතුය. එසේ ගැවුනහොත් භාජනය තුළ සිටින ගැඩවිලන් එම පටි දිගේ පිටතට යා හැක.

මෙම පණුදියර පොහොර, කාබනික දියර පොහොරකි. කාබනික වගාවකදී පොහොරක් ලෙසද, ශාක වර්ධනය උත්තේජනය කරන හෝමෝන ද්‍රාවණයක් ලෙසද, වගාව රෝග, පලිබෝධ වලින් ආරක්‍ෂා කර ගැනීමටද මෙය වැදගත් වේ (වගාව රෝග, පලිබෝධවලින් ආසාදනය වූ පසු මෙය යෙදීමෙන් ප්‍රයෝජනයක් නොවේ).

පනු දියර පොහොරවල අඩංගු ශාක වර්ධක හෝමෝන ප්‍රතිජීවක වැනි රසායනික ද්‍රව්‍ය හිරු එළියේදී විනාශ විය හැකි බැවින්, ඒවා ගබඩා කරන්නේ නම් හිරු එළියෙන් ආවරණය වන ලෙස තබන්න. මේවා දිගුකල් ගබඩා කිරීමේදී පෝෂකවල සංයුතිය වෙනස් විය හැක.

පණු දියර පොහොරවල රසායනික සංයුතිය

පෝෂ්‍ය පදාර්ථ	
කාබනික ද්‍රව්‍ය	0.07
නයිට්‍රජන් එකතුව – N (%)	0.04
නයිට්‍රේට් – NO_3 (mg/kg)	-
ඇමෝනියම් – NH_4 (mg/Kg)	-
පොස්පරස් – P (%)	ස්වල්ප ප්‍රමාණයෙන්
පොටෑසියම් – K (%)	0.62
මැග්නීසියම් – Mg (%)	0.029
කැල්සියම් – Ca (%)	0.073
සෝඩියම් – Na (%)	0.041
යකඩ – Fe (mg/Kg)	2.01
මැන්ගනීස්– Mn (mg/Kg)	3.42
කොපර් -Cu (mg/Kg)	0.172
සින්ක් – Zn (mg/Kg)	0.114

මූලාශ්‍රය: එම්.ඒ.කේ. විජේසිංහ මිය,
පර්යේෂණ නිලධාරිනී, කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය, මාකඳුර

මැකඩමියා භෝගය හඳුනා ගනිමු

මැකඩමියා ප්‍රොටියේසියේ කුලයට අයත් බෝගයක් වන අතර එහි මදයෙහි රසවත් භාවය නිසා ඉහල මිලකට අලෙවි වේ. චොකලට්, අයිස්ක්‍රීම් වැනි නිෂ්පාදන වලදී රසය වැඩිකර ගැනීම සඳහා මැකඩමියා මදය භාවිතා කරයි.

ප්‍රධාන වශයෙන් විශේෂ 2 කි. ඒවා *Macadamia integrifolia* සහ *Macadamia tetraphylla* ලෙස හඳුන්වයි. මෙම බෝගය සම්භවය වී ඇත්තේ මධ්‍යම නැගෙනහිර ඔස්ට්‍රේලියාවේ වන අතර පසුව හවායි දූපත් කරා සංක්‍රමණය වී ඇත. මෙය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ 1980 දී පමණය. නමුත් ලංකාවට සුදුසු මැකඩමියා ප්‍රභේද පිළිබඳව තොරතුරු සහ දැනුම මද බැවින් ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් මේ පිළිබඳව අධ්‍යයනයන් සිදු කර මෙම බෝගය වාණිජ වගාවක් වශයෙන් ප්‍රචලිත කිරීමේ කාර්යයක නිරතව සිටී.

මෙහිදී *Macadamia integrifolia* විශේෂය යටතට ගැනෙන ප්‍රභේද ලෙස 800, 778, 788, 246, 344, 385 හඳුනාගෙන ඇති අතර *Macadamia tetraphylla* යටතට 660 හා 346 යන විශේෂ අයත් වේ. *Macadamia tetraphylla* විශේෂයේ අතුවල එක් ගැටයකින් පත්‍ර 4 ක් හට ගනී. මෙහි පුෂ්ප මංජරිය රෝස පැහැයක් ගනී. *Macadamia integrifolia* විශේෂයේ අතුවල එක් ගැටයකින් පත්‍ර 3 ක් හට ගනී. මෙහි පුෂ්ප මංජරිය සුදු පැහැයක් ගනී. මල් පිපීම ජනවාරි සහ පෙබරවාරි මාසවලත් ඵල අස්වනු නෙලීම ජූනි, ජූලි මාසවලත් සිදු වේ. බීජ පැළයකින් ඵල හට ගැනීම ආරම්භ වන්නේ පැළයක් සිටුවා වසර 8 -11 කට පසුවය.

පුෂ්ප මංජරිය

බද්ධ පැලයකින් වසර 6 කදී පමණ අස්වැන්න නෙලා ගත හැකිය. මේ සඳහා සාර්ථකම ප්‍රචාරණ ක්‍රමය වනුයේ කුඤ්ඤ බද්ධයයි.

කුඤ්ඤ බද්ධය සිදු කරන ආකාරය

මෙහිදී කරන ලද පරීක්ෂණ අතුරින් මදයේ බරෙහි ඉහලම අගය (තෙත් බර ග්‍රෑම් 4) වාර්තා වුයේ 778 සහ 800 යන ප්‍රභේද දෙකෙහිය. මනා පාලනයක් සහිතව නඩත්තු කල වගාවකින් හොඳ අස්වැන්නක් මෙම ප්‍රභේද දෙකේම ලබා ගත හැකි අතර තවදුරටත් මේ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරනු ලබයි.

ජල ප්‍රතිශතය සහ මේද අම්ල ප්‍රමාණය වැඩි වෙනසක් නොමැති වුවත් මේද ප්‍රතිශතය සලකා බැලූ කල 778 සහ 800 ප්‍රභේද අනෙකුත් ප්‍රභේදවලට වඩා වැඩි අගයක් ගනී. මෙහි ගුණාත්මය රඳා පවතින්නේ මේද ප්‍රතිශතය අනුව බැවින් අනෙකුත් ප්‍රභේද හා සංසන්දනය කර බැලීමේදී 778 සහ 800 ප්‍රභේද වඩා සුදුසු බව පෙනුනි. එනිසා මෙම ප්‍රභේද දෙක 2007 වසරේදී **ලංකා** (778) සහ **හර්ෂ** (800) යන නම් වලින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කර ඇත.

මැකඩමියා ඵල හා මදය

මැකඩමියා ඵල



මැකඩමියා යෙදූ විවිධ නිෂ්පාදන

ප්‍රභේද සංවර්ධනය: ඉන්ද්‍රාණී මැදගොඩ මිය,
උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව